කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
விவசாய நவீனமயமாக்கல் திட்டம்
Agriculture Modernization Project

THE WORLD BANK

# කෘෂිකර්ම අමාත්‍යාංශය

## කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය - (ලෝක බැංකුව මගින් අරමුදල් සපයන)

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම (මධ්‍යම පළාත)

සුළු පරිමාණ ගොවීන් හට තරගකාරී සහ අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කිරීමට, වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සහ වාණිජකරණය කරා යොමු වීමට සහය වීමට රටවල් සමග හවුල්කාරීත්ව උපාය මාර්ගයක් (CPS) සමග අනුකූල වෙමින් කෘෂි නවීකරණ ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයීමට ලෝක බැංකුවේ අන්තර්ජාතික සංවර්ධන ඒජන්සිය මගින් එකඟ වී ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලය වසර 05 ක් වන අතර, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම ඇමරිකානු ඩොලර් මිලියන 64.33 වන අතර 2023 වර්ෂයේදී අවසන් කිරීමට අපේක්ෂිතය.

2019.03.15 දින දරන, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ට අනුව පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අපේක්ෂකයින්ගේ මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් මධ්‍යම පළාතේ පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### කෘෂි විද්‍යාඥ (PS3) තනතුරු 01 යි

**අවශ්‍ය සුදුසුකම් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක සාමාජිකත්වය / පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තීය සුදුසුකම් සමග

    කළමනාකරණ තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද

    හෝ

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියට සමාන අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෘත්තීය ආයතනයක සාමාජිකත්වය / පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන වෘත්තීය සුදුසුකම් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ අදාළ වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකයකු වීම සමග,

    කළමනාකරණ තත්ත්වයේ තනතුරක අවම වශයෙන් වසර 8 ක පළපුරුද්ද

    හෝ

03. රජයේ දීප ව්‍යාප්ත සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් සමග,

    පළමු පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 3 ක පළපුරුද්ද

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

සුදුසුකම් සහ පළපුරුද්ද මත පාදකව, කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

වැටුප : 2019.03.15 දිනැතිව නිකුත් කළ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මත පදනම් වනු ඇත.

**පොදු කොන්දේසි :**

අ) **වයස් සීමාව :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වනවිට වයස අවුරුදු 64 නොඉක්මවා තිබීම.

ආ) **සේවා කොන්දේසි -** රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරීන් ද්විතීය පදනම මත බඳවාගනු ලබන අතර, රජයේ සේවයෙන් බැහැර අයවළුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. සියලුම පත්වීම් සහ සේවා කාලය දීර්ඝ කිරීම 2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පාදක කර සිදු කරනු ලැබේ.

**අයදුම්පත් :**

සෑම අයදුම්කරුවෙක්ම තම අයදුම්පත්‍ර, ජීව දත්ත සහිතව, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් සමග, ලියාපදිංචි තැපෑලෙන් "**ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත් සභා සංකීර්ණය, පල්ලෙකැලේ, කුණ්ඩසාලේ**" යන ලිපිනයට 2021 ජූලි මස 28 වන දිනට හෝ ඊට ප්‍රථම යොමු කළ යුතු වේ.

දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානී හරහා යොමු කළ යුතුය.

අයදුම් කරනු ලබන තනතුර, අයදුම්පත්‍රය බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන්කර එවිය යුතුය.

ඉහත බඳවා ගැනීම සම්බන්ධව ප්‍රධාන ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

මේ පිළිබඳව යම් පැහැදිලිකර ගැනීමක් අවශ්‍ය වේ නම් 066-2051710 දුරකථන අංකයෙන් හෝ dicmb@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනයෙන් පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, (මධ්‍යම පළාත) මාතලේ වෙතින් ලබාගත හැක.

**ගාමිණී රාජරත්න**
**ප්‍රධාන ලේකම්, මධ්‍යම පළාත,**
**මධ්‍යම පළාත් සභා සංකීර්ණය,**
**පල්ලෙකැලේ, කුණ්ඩසාලේ.**
**2021.06.27**